# පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ
# පෙරමග දශක කණ්ඩායම විසින් 2019 ජුනි මස 30 වන දින පවත්වන ලද
# අතුරු මහ සභා වර්තාව

**සහභාගිත්වය**

බුද්ධික රොෂාන් - සභාපති
ගයානි කොස්වත්තගේ - ලේකම්
වෙනුර කසුන්සිරි - භාණ්ඩාගාරික

**ආරම්භය**

ක්‍රි.ව 2019ක් වූ ජුනි මස 30 වන දින පෙ.ව 9.00 ට විද්‍යාලියය ශාලාවේ දී සියලු පාර්ශවයන්ගේ සහභාගිත්වයෙන් ආගම සිහි කිරීමෙන් හා අප අතරින් වියෝ වූ රණවිරුවන්, ආදි ධර්මපාලියන් සැමරීම වස් විනාඩියක නිශ්ශබ්දතාවයකින් අනතුරුව සභාවේ වැඩකටයුතු ආරම්භ විය.

**පිළිගැනීමේ කථාව**

අතුරු මහා සභාව රැස්වීමට පැමිණි සියළු දෙනා පිළිගනිමින් ගරු සභාපති බුද්ධික රොෂාන් මහතා සභාව අමතන ලදී.

**වාර්ථාව සභා සම්මත කර ගැනීම**

පැමිණ සිටින සියලු දෙනා වෙත ලබා දී තිබූ 12 වන මහ සභා වර්තාව සංජය මහතාගේ යෝජනාවෙන් හා නදිශා රාජිනි මහත්මියගේ ස්ථිරත්වයෙන් සත්‍ය වර්තාවක් ලෙස සභා සම්මත විය.

**ප්‍රගති සමාලෝචනය හා ඉදිරි වැඩ කටයුතු**

2019 / 2020 පරිපාලන වර්ෂයේ දි දැනට අප සංගමය මගින් සිදුකරන කරන ලද ව්‍යාපෘති පිළබඳ ප්‍රගති සමාලෝචනය හා ඉදිරියෙදි සිදු කිරීමට නියමිත ව්‍යාපෘතින් පිළිබදව ගරු සභාපති බුද්ධික රොෂාන් මහතා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

- 6-9 ශ්‍රේණි සඳහා ඉදිකල වැසිකිළි පද්ධතියේ නවීකරණය කටයුතු සිදුකිරීම.
- ගණිතාගාරය අළුත්වැඩියා කිරීම.
- පාසල තුල එල්ලා ඇති නාම පුවරු අළුත්වැඩියා කිරීම.
- ඩෙස් පුටු අළුත්වැඩියා කිරීම.
- පෙරමග පොකුර - පෙරමග සාමාජික සාමාජිකාවන්ගේ දක්ත ගොනුවක් සැකසීම
- පෙරමග කුසලානය
- පරිඝණක විද්‍යාගාරය අසල දැල් වැට ප්‍රතිසංස්කරනය
- පාසලේ ප්‍රථමික අංශයේ පානිය ජල පද්ධතිය අළුත්වැඩියා කිරීම
- පාසලේ උසස් පෙළ විද්‍යාගාර වල අඩුපාඩු සැකසීම

<u>**ගිණුම් කටයුතු**</u>

දැනට සංගමයේ ගිණුම් තත්වය පිළිබදව ගරු භාණ්ඩාගාරික වෙනුර කසුන්සිරි මහතා සභාව දැනුවත් කරන ලදී.

දැනට සංගමය සතුව පවතින රුපියල් මිලියන හතරක ස්ථාවර තැම්පතුවෙන් ලැබෙන මාසික පොලි මුදලින් අප පාසලේ ඉගනුම ලබන අඩු ආදයම් සහිත දරුවන් හට ශිෂ්වත්ත ලබාදීමට වෙනුර කසුන්සිරි මහතා විසින් සභායට යෝජනාවක් ගෙන එන ලදි. හම යෝජනාව වරුණ විජයසේකර මහතා විසින් ස්ථිර කරන ලදී.

<u>**ප්‍රධාන මුලෙයා්ත්පාදන ව්‍යාපෘතිය**</u>

සෑම වසරකදීම මෙන්ම මෙම වසරේදිද ප්‍රධාන මුලෙයා්ත්පාදන ව්‍යාපෘතිය ලෙස" අනාගතයේ " colour by Wayo සංගිත පුසංගය 2019.08.17 වන දින සවස 6.00ට මහරගම තරුණ සේවා ශාලාවේදි පැවැත්වීමට කයුතු සුදානම් කර ඇති බවත් ඒ සඳහා ආරාධිත ගයන ශිල්පීන් ලෙස මරියසෙල් ගුණතිලක මහත්මිය හා ශිහාන් මිහිරංග මහතාත් සහභාගිවන බව ගරු සභාපති බුද්ධික රොෂාන් මහතා විසින් සභාව දැනුවත් කල අතර ඒ සදහා සියළුම සමාජික සාමාජිකාවන්ගේ සහයෝගය අපේක්ෂා කරන බව ප්‍රකාශ කරමින් සභාවේ වැඩ කටයුතු අවසන් කෙරෙනි.

ගයනි කොස්වත්තගේ

ප්‍රධාන ලේකම්